**සවියෙන් පෙරට - අපි එකට**

*e* – **ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**



| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 6 | ඉතිහාසය | 3 | 05. අපේ අතීත රජවරු<br>**VII කොටස - ධාතුසේන රජතුමා** |



**සැකසුම - කේ .එස් පවනි සිසින්ද්‍රා**

**බප/හො/ ප්‍රජාපතී බාලිකා විද්‍යාලය**



# ධාතුසේන රජතුමා



කලා වැවේ දිය දහරයි
යෝධ ඇළයි යෝධ වැවයි
අවුකන පිළිමය කරවූ
ධාතුසේන රජුගෙ වැඩයි

රජුගේ පියා - දාඨානාම නම් තැනැත්තෙකි

රාජ වංශය - මෞර්යය

රාජ්‍ය කාලය - වසර 18 යි

දරුවන් - කාශ්‍යප හා මුගලන්

(පුතුන් දෙදෙනා ) හා

එක් දියණියක්

වසර 30 ක් මෙරට පාලනය කළ දකුණු ඉන්දීය ආක්‍රමණිකයින්ගෙන් (සත් ද්‍රවිඩයින්ගෙන්) රට බේරා ගෙන රාජ්‍යත්වයට පත්වීම ධාතුසේන රජුගේ විශිෂ්ටතම කාර්යයකි.

# ධාතුසේන රජුගේ ආර්ථික සේවාවන්



- සත් ද්‍රවිඩ ආක්‍රමණිකයින්ගෙන් රට බේරා ගැනීම.
- මහ වැව් 18 ක් ඉදි කිරීම.
- කුඩා වැව් 18 ක් ඉදි කිරීම.
- කලා වැව මෙතුමා ඉදි කළ විශිෂ්ටතම වාරි කර්මාන්තයයි.
- කලා වැවේ සිට තිසාවැව දක්වා ජලය ගෙන යාමට යෝධ ඇළ හෙවත් ජය ගඟ ඉදි කිරීම.
- යෝධ ඇළේ දිග සැතපුම් 54 කි.
- මෙහි සැතපුමකට අගල් හයක බෑස්මක් තිබේ.

# ධාතුසේන රජුගේ ආගමික සේවාවන්



- ධාතුසේන රජු වෙහෙර විහාර 18 ක් ඉදි කර බුදු දහමේ උන්නතියට විශාල සේවයක් කළේ ය.
- වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කළේ ය.
- භික්ෂූන්ට ඇප උපස්ථාන කිරීම.
- භික්ෂූන්ට දානය වැළඳීමය මහාපාලි දාන ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම
- අනුරාධපුරයේ අවුකන පිළිමය ධාතුසේන රජු විසින් කර වූ බවට විශ්වාසයක් පවතී.

# රජු ඉදි කළ කලා වැව








# රජු ඉදි කළ යෝධ ඇළ හෙවත් ජය ගඟ





# රජු ප්‍රතිසංස්කරණය කළ
# මහාපාලි දාන ශාලාවේ වර්තමාන නටබුන්





රජු ඉදි කළා යැයි විශ්වාස කෙරෙන අනුරාධපුරයේ **අවුකන පිළිමය**



# ධාතුසේන රජුගේ චරිතයෙන් අපට ලබාගත හැකි ආදර්ශ



- පුරවැසියෙකු ලෙස සමාජයට එක් වූ පසුව ජනතාව වෙනුවෙන් අවංකව කැප වී සේවය කිරීම.
- ජනතාවගේ අවශ්‍යතා තේරුම්ගෙන ඒවා ඉටුකර දීම.
- රටේ ආරක්ෂාව වෙනුවෙන් සෑම විටම කැපවීමෙන් ක්‍රියා කිරීම්
- නව නිර්මාණ කිරීමට සෑම විටම පෙළඹීමෙන් යුතුව ක්‍රියා කිරීම.
- උත්සාහවන්තව කටයුතු කිරීම.

සවියෙන් පෙරට අපි එකට

e- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 6 | ඉතිහාසය | 3 | 05. අපේ අතීත රජවරු<br>VII කොටස - ධාතුසේන රජතුමා<br>--ඇගයීම-- |

සැකසුම කේ.එස්. පවනි සිසින්ද්‍රා, බප/හො/ ප්‍රජාපතී බාලිකා විද්‍යාලය

1 . ධාතුසේන රජුගේ පියා නම් කරන්න.

2 . ධාතුසේන රජු වසර කීයක් රට පාලනය කළේ ද?

3 . ධාතුසේන රජුගේ පුතුන් දෙදෙනා නම් කරන්න.

4 . ධාතුසේන රජුගේ රාජ වංශය නම් කරන්න.

5 . ධාතුසේන රජු ඉදි කළ විශිෂ්ටතම වැව කුමක් ද?

6 . කලා වැවේ සිට තිසා වැව දක්වා ජලය ගෙන යාමට ධාතුසේන රජු ඉදි කළ ඇළ නම් කරන්න.

7 . ධාතුසේන රජු බුදු දහමේ උන්නතිය සඳහා ඉටු කළ සේවාවන් දෙකක් ලියන්න.

8 . ධාතුසේන රජුගේ චරිතයෙන් ඔබගේ ජීවිතයට ලබාගත හැකි ආදර්ශ දෙකක් ලියා දක්වන්න .

සවියෙන් පෙරට අපි එකට
e- ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 6 | ඉතිහාසය | 3 | 05. අපේ අතීත රජවරු<br>VII කොටස - ධාතුසේන රජතුමා<br>--පිළිතුරු-- |

සැකසුම කේ.එස්. පවනි සිසින්ද්‍රා, බප/හො/ ප්‍රජාපතී බාලිකා විද්‍යාලය

1 දාඨානාම

2 වසර 18 ක්

3 කාශ්‍යප හා මුගලන් යන කුමාරවරු දෙදෙනා

4 මෞර්යය රාජ වංශය

5 කලා වැව

6 ජය ගඟ හෙවත් යෝධ ඇළ

7

- වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම.
- භික්ෂූන්ට ඇප උපස්ථාන කිරීම.
- භික්ෂූන්ට දානය වැළඳීමට මහාපාලි දාන ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම.
- වෙහෙර විහාර 18 ක් ඉදි කිරීම

8

- පුරවැසියෙකු ලෙස සමාජයට එක් වූ පසුව ජනතාව වෙනුවෙන් අවංකව කැප වී සේවය කිරීම.
- ජනතාවගේ අවශ්‍යතා තේරුම්ගෙන ඒවා ඉටුකර දීම.
- රටේ ආරක්ෂාව වෙනුවෙන් සෑම විටම කැපවීමෙන් ක්‍රියා කිරීම.
- නව නිර්මාණ කිරීමට සෑම විටම පෙළඹීමෙන් යුතුව ක්‍රියා කිරීම.
- උත්සාහවන්තව කටයුතු කිරීම.